"ප්‍රේමයෙන් මුසපත් වී බැගයෙන් සහ කඹයෙන් අවසන් ගමනේ..." යන සිරස්තලයෙන් යුතුව දිවයින ඉරිදා සංග්‍රහයේ පළ වූ විශේෂාංග ලිපිය තුළ, අදාළ අය දිවි තොර කරගෙන සිටිනා ආකාරය දැක්වෙන ඡායාරූපයක් මාධ්‍ය ආචාර ධර්මයන්ට මුළුමනින්ම විරුද්ධව යමින් පළ කොට තිබිණි.

දිවි තොර කරගැනීමක තොරතුරු දැක්වෙන ඡායාරූප පළ නොකළ යුතු බව ඒ පිළිබඳ ජාත්‍යන්තර මාර්ගෝපදේශයන් මගින් පැහැදිලිවම දක්වයි. ඊට අමතරව එවැනි ඡායාරූපයක් මගින් අදාළ පුද්ගලයාගේ පවුලේ අයවලුන්ට ඇති විය හැකි සිත් වේදනාවද නොසලකා හැරිය හැකි නොවේ.

මෙවැනි සිදුවීම් ආවරණය කිරීමේදී මාධ්‍යයක් තම අවම සදාචාරය හෝ පවත්වා ගත යුතු බවත්, වගකීම් සහිත විය යුතු බවත් අපි මෙසේම අවධාරණය කරමු.

මූලාශ්‍ර:

https://apps.who.int/iris/bitstream/handle/10665/258814/WHO-MSD-MER-17.5-eng.pdf;jsessionid=55237240456D70AC099D3B9F7B2B10DB?sequence=1

මෙම ලිපියට අදාළ අපගේ අනෙක් පෝස්ටුවට සබැඳිය:
https://www.facebook.com/ethicseye/posts/1378521639169556

#MediaEthicsSL #lka #SinhalaPress